# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2208/1 - 2020 දෙසැම්බර් මස 28 වැනි සඳුදා - 2020.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 17745 දරන සමාගමක් වන සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2020 ජනවාරි මස 6 වැනි දින අංක 2157/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතය දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන හා II වන තීරයන් හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් (SLQF 9 වන ස්ථරය) අධ්‍යයන ක්‍රියාකාරකම් මගින් වන ව්‍යාපාර පරිපාලනපති උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, මෙහි පහත දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා යෝග්‍යතා ක්ෂේත්‍රයෙහි (SLQF) නියම කොට ඇති ආකාරයෙන් -

(*අ*) ප්‍රථම උපාධිය -

(i) කළමනාකරණය හෝ ව්‍යාපාර සහ ආර්ථික විද්‍යාව යන අදළ විෂයය ක්ෂේත්‍ර යටතේ අධ්‍යයන සම්භාර 30ක් සහිතව සම්පූර්ණ කර තිබීම ; හෝ

(ii) අදාළ විෂයය ක්ෂේත්‍රයේ අධ්‍යයන සම්භාර 30ට සමාන වන පරිදි, කළමනාකරණය හෝ ව්‍යාපාර විෂයය ක්ෂේත්‍රයන්ගෙන් ලබාගත් පූර්ව ඉගෙනීම් හෝ රැකියා පළපුරුද්ද සමග සම්පූර්ණ කර තිබීම ; හෝ

(ආ) ඉහත (අ) (i) හෝ (අ) (ii)ට සමාන වන පරිදි, කළමනාකරණය හෝ ව්‍යාපාර සහ ආර්ථික විද්‍යාව යන අදළ විෂයය ක්ෂේත්‍ර යටතේ ලබාගත් සුදුසුකමක් සහිත වීම ; හෝ

(ඇ) නිශ්චිත බලධරයා විසින් නිශ්චය කළ හැකි පරිදි NVQ 7 වන මට්ටම සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූල විය යුතු අතර යෝග්‍යතා නාමයට වෙනත් යෝග්‍යතා ක්ෂේත්‍රයක් හෝ විශේෂණයක් සම්බන්ධ කරනු නොලැබිය යුතු ය, යන කොන්දේසියට අනුකූල විය යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පාඨමාලා ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය පිරිනැමීම සඳහා සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට අවසර දෙනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| අධ්‍යයන ක්‍රියාකාරකම් මගින් වන ව්‍යාපාර කළමනාකරණපති උපාධිය | එම්බීඒ (අධ්‍යයන ක්‍රියාකාරකම් මගින්) |

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

---

එල්.ඩී.බී. 21/78 (xiv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20 (4)(ආ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ, පරිපාලන කටයුතු බරපතල ලෙස ව්‍යාකූල වී ඇති බවට සහ එය සාමාන්‍ය තත්වයට නැවත පත් කිරීමට එම ආයතනයේ බලධාරීන් අපොහොසත් වී ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂක වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙලින් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා එකී ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට නිසි බලධරයා වශයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා අබේවික්‍රම ලියනගේ 2020 දෙසැම්බර් මස 13 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමය මගින් පත් කරමි.

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.